සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

07 ශ්‍රේණිය | ක්‍රිස්තියානි ධර්මය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. දෙවියන් වහන්සේ ඒදන් උයන තනා තිබුණේ කුමන දිශාවේ ද?

(1) අපර දිශාවේ ය. (2) පූර්ව දිශාවේ ය.

(3) දකුණු දිශාවේ ය. (4) උතුරු දිශාවේ ය.

02. ස්නාවක ජොහාන් තුමා ''පොළොං වංශය'' කියා ආමන්ත්‍රණය කළේ,

(1) පරිසිවරු හා විනයධරයන්ට ය. (2) ලියන්නන් හා සද්දුසිවරුන්ට ය.

(3) පරිසිවරුන් හා හෙරොදිවරුන්ට ය. (4) පරිසිරු හා සද්දුසිවරුන්ට ය.

03. ජේසුස් වහන්සේ උත්ථානය වූ බව ස්පර්ශයෙන් පමණක් විශ්වාස කළ ගෝලයා වන්නේ,

(1) තෝමස් ය. (2) ජාකොබ් ය. (3) ජොහාන් ය. (4) සිමොන් ය.

04. සුදර්ශන දොරටුව අසළ දී සුවය ලැබුයේ,

(1) ලාදුරු රෝගියෙකි. (2) අංශභාග රෝගියෙකි.

(3) උපන් දා පටන් කොර ව සිටි මිනිසෙකි. (4) අතක් පණ නැති අයෙකි.

05. පළගැටියන් හා වන මී ආහාරය ගත්තේ,

(1) සීමෝන් පේදුරු ය. (2) ස්නාවක ජොහාන්තුමා ය.

(3) ජුදස් ඉස්කාරියෝත් ය. (4) දිවැසිවර එළියා ය.

- **අංක 06 සිට 10 දක්වා දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදිනම් (✗) ලකුණ ද යොදන්න.**

06. අපගේ සතුරාට අප ප්‍රේම කළයුතු බව ජේසුස් වහන්සේ පැවසීය. ( )

07. පෙන්තකොස්ත දින ශුද්ධාත්ම ආගමනය සිදුවුණි. ( )

08. ජේසුස් වහන්සේ ඉගැන්වීම් කටයුතු සඳහා තෝරාගත්තේ ජනාකීර්ණ ප්‍රදේශ ය. ( )

09. ''මාගේ ස්වාමීනී, මාගේ දෙවියනි'' යනුවෙන් පැවසුවේ තෝමස් ය. ( )

10. සියල්ල පොදුවේ තබාගැනීම මුල් කිතුණු සභාව තුළ නොතිබූ ලක්ෂණයකි. ( )

- **A කොටසින් දැක්වෙන ප්‍රකාශයට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | A | | B |
|---|---|---|---|
| 11. | පෙන්තකොස්ත දින දේශනය සිදුකළේ | ⋆ | යාච්ඤාවයි. |
| 12. | කාන්තාරය හරහා ගමන්ගත් ඊශ්‍රායෙල් ජනතාවට රාත්‍රී කාලයේ මඟ පෙන්වන ලද්දේ | ⋆ | ඉල්ලීම. |
| 13. | මුල් කිතුණු සභාවේ පදනම වූයේ | ⋆ | පේදුරු ය. |
| 14. | යාච්ඤාව තුළ ඇති පොදු ලක්ෂණයකි. | ⋆ | නිහතමානීකම. |
| 15. | ස්වානක ජොහාන්තුමා සතු ගුණාංගයකි. | ⋆ | ගිනිටැඹ. |

- **අංක 16 සිට 20 දක්වා දී ඇති වාක්‍යවලට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

16. උත්ථාන වූ ජේසුස් වහන්සේ දින .................................................................. පුරාවට ශ්‍රාවකයක් ඉදිරියේ පෙනී සිටිය සේක.

17. පැරණි ගිවිසුම තුළ දෙවියන් වහන්සේගේ වැඩවිසීම.............................................................. තුළින් සංකේතවත් විය.

18. ''ස්වාමීනී මාගේ පාද පමණක් නොව අත් ද හිස ද සේදුව මැනව'' යනුවෙන් ......................................... තුමා පවසන ලදී.

19. අන්තිම රාත්‍රී භෝජනය දවසේ දී ජේසුස් වහන්සේ රොටි යනුවෙන් අදහස් කළේ උන්වහන්සේගේ ...................................................................................... යි.

20. වැස්ස ඇතිවීම ...................................................................... දේව මැවිල්ලකි.

(වක්‍රාකාර, ජාකොබ්, හතලිහක්, ශරීරය, ගින්න, ජලය, පේදුරු)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (i) ස්නාවක ජොහාන්තුමා ඇඳගෙන සිටියේ මොනවා ද?

(ii) කිතුණු දරුවෙකු ලෙස පවුලෙන් ඔබට ලැබෙන වටිනාකම් දෙකක් ලියන්න.

(iii) ජුදා ආගමික නායකයින් දෙදෙනෙකු නම් කරන්න.

(iv) ඔබේ සතුරන්ට .......................... කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා .............................. කරන්න. මෙහි හිස්තැනට අදාළ වචන දෙක ලියා දක්වන්න.

(v) ස්නාවක ජොහාන් තුමාගේ මව හා පියාගේ නම් ලියා දක්වන්න.

(vi) ජේසුස් වහන්සේ ඉගැන්වීම සඳහා තෝරාගත් ස්ථාන දෙකක් ලියන්න.

(vii) පෙන්තකොස්ත දින සිදු වූ විශේෂ සිද්ධි දෙකක් ලියන්න.

(viii) චක්‍රාකාර දේව මැව්ලි දෙකක නම් ලියන්න.

(ලකුණු 2 × 8 = 16)

02. (i) දෙව්පියාණන් වහන්සේ මිනිසාට ලබා දුන් වගකීම් දෙකක් ලියන්න.

(ii) මිනිසා විසින් පරිසරය විනාශ කරනු ලබන අවස්ථා දෙකක් ලියා දක්වන්න.

(iii) පරිසරය ආරක්ෂා කිරීමට ඔබට කළ හැති කාර්යයන් හයක් ලියන්න.

(ලකුණු 2 + 3 + 6 = 11)

03. (i) ජේසුස් වහන්සේ සමඟ ගෙත්සෙමන උයනට පිටව ගිය ශ්‍රාවකයින් දෙදෙනෙකුගේ නම් ලියා දක්වන්න.

(ii) ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය හා රුධිරය වන රොටි හා මිදි යුෂ පිළිගැනීමට පෙර අප ඒ සඳහා සහභාගීවිය යුතු ආකාර තුන ලියා දක්වන්න.

(iii) ලෝකයේ ආලෝකය ලෙස ජීවත්වන අපට සමාජය තුළ කළ හැකි සේවාවන් හයක් ලියන්න.

(ලකුණු 2 + 3 + 6 = 11)

04. (i) අද සමාජයේ දරුවන්ට විඳීමට සිදුව ඇති පීඩාවන් දෙකක් ලියා දක්වන්න.

(ii) මුල් කිතුණු සභාවේ පැවති ලක්ෂණ තුනක් ලියා දක්වන්න.

(iii) අද සමාජයේ දරුවන්ගේ ළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ආයතන පහක නම් ලියාදක්වන්න.

(ලකුණු 2 + 3 + 6 = 11)

05. (i) රන් අණ ලියා දක්වන්න.

(ii) ජේසුස් වහන්සේ කුරුසපත් කිරීමට පෙර ඊට ආසන්න ව සිදු වූ විශේෂ සිදුවීම් තුනක් ලියා දක්වන්න.

(iii) අපට සතුරුකම් කරන්නන් උදෙස අප කළයුතු දේවල් හයක් ලියා දක්වන්න.

(ලකුණු 2 + 3 + 6 = 10)

06. (i) ස්නාවක ජොහාන් තුමාගේ අති විශේෂ මෙහෙය ගැන දිවැස් වැකි ප්‍රකාශ කළ දිවැසිවරයා කවු ද?

(ii) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂාවන් තුන ලියා දක්වන්න.

(iii) අද සමාජයේ පාසල් දරුවන්ට මුහුණ දීමට සිදු ව ඇති පරීක්ෂාවන් හයක් ලියා දක්වන්න.

(ලකුණු 2 + 3 + 6 = 11)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 06 | ✓ | 11 | පේදුරු | 16 | පහනක් |
| 02 | 4 | 07 | ✓ | 12 | ගිහිටැඹ | 17 | ගින්න |
| 03 | 1 | 08 | × | 13 | යාච්ඤාව | 18 | පේදුරු |
| 04 | 3 | 09 | ✓ | 14 | ඉල්ලීම | 19 | ශරීරය |
| 05 | 2 | 10 | × | 15 | නිහතමානීකම | 20 | වක්‍රාකාර |

## II කොටස

01. (i) ඕටුලොම් වස්ත්‍රය
(ii) ආදරය / රැකවරණය / පරිත්‍යාගය / දිරිගැන්වීම / සමාව දීම හා ලැබීම. (12 පිටුව)
(iii) පරිසිවරු / සද්දුසිවරු
(iv) ප්‍රේම කරන්න. / යාච්ඤා කරන්න.
(v) මව - එලිසබෙත් තුමිය, පියා - සෙකරියස් තුමා
(vi) කඳුමුදුන් / මිටියාවත් / මුහුදුවෙරළ / සාමාන්‍ය ජනයා වෙසෙන ඉඩකඩ ඇති නිවාස.
(vii) සැඩ සුළඟක් වැනි හඬක් ඇසීම / ගිනිදළු වැනි දිව් හිස් මත පතිත වීම. (පිටු 43 හා 44)
(viii) වැස්ස / දිවා රෑ ඇතිවීම /බීජයක් පැළයක් හටගැනීම. (පිටු අංක 09) (ලකුණු 2 × 8 = 16)

02. (i) දරු සම්පත් ලබා වර්ධනය වීම. / පොළොව පුරා පැතිර එය පාලනය කිරීම / සතුන් නඩත්තු කිරීම හා පාලනය / භූමිය රැකගැනීම හා වගා කිරීම / මැවිල්ලෙන් නිසි ප්‍රයෝජන ගැනීම. (ල. 02)
(ii) ගස් කපා වනාන්තර එළිපෙහෙළි කිරීම. / අපවිත්‍ර ජලය පිරිසිදු ගංගාවලට මුදා හැරීම. / වායු දූෂණය / පරිසර දූෂණය ආදී ගැළපෙන පිළිතුරු තුනක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 03)
(iii) නිවස අවට පරිසරය සුරැකීම. / පාසල අවට පරිසරය පිරිසිදුව පවත්වාගෙන යාම. / පරිසරය සුරකින ශ්‍රමදාන ආදීයට සම්බන්ධ වීම ආදී ලියා ඇති නිවැරදි පිළිතුරු හයකට ලකුණු ලබා දෙන්න. (ල. 06)
(ලකුණු 2 + 3 + 6 = 11)

03. (i) පේදුරු / ජාකොබ් / ජොහාන් (පිටු 32) (ල. 02)
(ii) උන් වහන්සේ අපගේ පාප උදෙසා කුරුසයේ දී පූජා වූ බව විශ්වාස කිරීම. / අපගේ පාප ගැන පසුතැවිලි වීම. / අපගේ ජීවිත ගැන යථාවබෝධයක් ඇතිකර ගැනීම. (පිටු 30) (ල. 03)
(iii) දරුවා ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 06)
(ලකුණු 2 + 3 + 6 = 11)

04. (i) පාරිසරික හේතු නිසා අනාථ වීම / දුප්පත්කම නිසා ඇතිවන බලපෑම / විවිධ හිංසනවලට ගොදුරුවීම. / මව පියා විදේශගතවීම ආදී.. (පිටු 02) (ල. 02)
(ii) ඉගැන්වීම / සහභාගීකම / රොටි කැඩීම / යාච්ඤාව/ සියල්ල පොදුවේ තබා ගැනීම. (ල. 03)
(iii) ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය / ශ්‍රී ලංකා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය / පරිවාස හා ළමා රක්ෂණ අරමුදල (පිටු 04) (ල. 06)
(ලකුණු 2 + 3 + 6 = 11)

05. (i) ''අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමති ද ඔබත් ඒ දේම ඔවුන්ට කරන්න.'' (ල. 02)
(ii) අන්තිම රාත්‍රී භෝජනය / ගෝලයින්ගේ පාද සේදීම. / ගෙත්සෙමන උයනෙහි යාච්ඤාව (ල. 03)
(iii) පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කිරීම. / සතුරාට ප්‍රතිවිරුද්ධව ක්‍රියා නොකිරීම. / සතුරාට ප්‍රේම කිරීමට අවශ්‍ය ශක්තිය ඉල්ලා යාච්ඤා කිරීම. / පීඩා හමුවේ යහපත් පැවැත්මෙන් කටයුතු කිරීම. / දේව දරුවන් ලෙස ලොවට ආදර්ශයක් වන ලෙස ජීවත්වීම. / පීඩා කරන්නන්ට වෛර නොකිරීම. (ල. 06)
(ලකුණු රී+ 3 + 6 = 11)

06. (i) දිවැසිවර යෙසායා. (ල. 02)
(ii) ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කිරීම. / යක්ෂයාට නමස්කාර කරන ලෙස පැවසීම. / දේව මාළිගාවේ කොත මුදුනින් පැනීමට කීම. (ල. 03)
(iii) මත්ද්‍රව්‍ය / අන්තර් ජාලය / ජංගම දුරකතනය / අයහපත් මිතුරු සබඳතා ආදී සිසුවා ලියා ඇති නිවැරදි පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න. (ල. 06)
(ලකුණු 2 + 3 + 6 = 11)